IHP
INSTITUTE FOR HEALTH POLICY

72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

# මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 ජූලි 18
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at’ ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at’ ihp.lk ට්විටර්: @ravirannaneliya

## ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය:

## *ජූනි මාසයේදී පාරිභෝගික විශ්වාසය සුළු වශයෙන් වෙනස් වූවද, තවමත් අශුභවාදී මට්ටම්වලම පවතී*

### *මහජනතාවට අනාගත ආර්ථිකය පිලිබඳව තවදුරටත් අඩු අපේක්ෂාවක් පැවතීම නිසා සියලු දර්ශක අශුභවාදී මට්ටම්වල පවතී*

සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ආයතනය (IHP), ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයෙන් (SLOTS) නිර්ණය කරන ලද පාරිභෝගික විශ්වාසනීය දර්ශකවල 2023 ජූනි මස යාවත්කාලීන කිරීම අද නිකුත් කළේය.



පාරිභෝගික හැඟීම් පිළිබඳ දර්ශකය (ICS), මහජනතාවගේ පුද්ගලික ආර්ථික තත්ත්වය සහ ජාතික ආර්ථික තත්ත්වය පිළිඹිබු කරන පුළුල් මිනුමක් වන අතර එය ජූනි මාසයේදී ලකුණු 1 කින් අඩු වී 24 දක්වා ලඟා වී ඇත. ICS ශුන්‍යයේ සිට උපරිමය 100 දක්වා පරාසයක පවතින අතර, ශුද්ධ අශුභවාදී මට්ටම 50 ට අඩු අගයන් මඟින් පෙන්නුම් කරයි.

අනාගතය පිලිබඳ විශ්ලේෂණය කරනු ලබන මිනුමක් වන පාරිභෝගික අපේක්ෂාවන් පිළිබඳ දර්ශකය (ICE) ලකුණු 2 කින් අඩුව ලකුණු 33 ක් දක්වා ලඟා වී ඇති අතර එමඟින් පෙන්නුම් කරන්නේ 2023 අප්‍රේල් මාසයේදී ඉහළ අගයක් පෙන්නුම් කල ද පසුව රට පිළිබඳව මහජනතාවගේ කෙටි හා දිගු කාලීන අනාගත අපේක්ෂාවන් සඳහා වන විශ්වාසය තවදුරටත් හීන වී ඇති බවයි.

වත්මන් තත්ත්ව පිළිබඳ (ICC) දර්ශකය ද සුළු වශයෙන් වෙනස් වෙමින්, ලකුණු 1 කින් වැඩිව ලකුණු 13 දක්වා ඉහළ ගොස් ඇත.

**IHP පාරිභෝගික විශ්වාසනීය දර්ශකයන් පසුගිය මාසයට සාපේක්ෂව වෙනස්වීම**

| මිනුම | ↓↑↔ | 2023 ජූනි | 2023 මැයි | 2023 අප්‍රේල් | 2023 මාර්තු | 2023 පෙබරවාරි | 2023 ජනවාරි | 2022 දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|
| පාරිභෝගික හැඟීම් දර්ශකය (ICS) | ↓1 | **24** | **25** | 26 | 17 | 12 | 15 | 16 |
| පාරිභෝගික අපේක්ෂාව පිළිබඳ දර්ශකය (ICE) | ↓2 | **31** | **33** | 35 | 22 | 17 | 22 | 22 |
| වත්මන් තත්ත්වයන් පිළිබඳ දර්ශකය (ICC) | ↑1 | **13** | **12** | 13 | 9 | 6 | 5 | 8 |
| පුද්ගලික මූල්‍ය තත්ත්වය (පසුගිය මාස 12) | ↔0 | **16** | **16** | 15 | 11 | 5 | 6 | 8 |
| පුද්ගලික මූල්‍ය තත්ත්වය (ඉදිරි මාස 12) | ↑3 | **31** | **28** | 35 | 23 | 20 | 23 | 22 |
| රටේ තත්ත්වය (ඉදිරි මාස 12) | ↓3 | **27** | **30** | 27 | 18 | 12 | 16 | 18 |
| රටේ දිගු කාලීන අපේක්ෂාවන් (ඉදිරි වසර 5) | ↓6 | **34** | **40** | 43 | 26 | 19 | 28 | 26 |
| වත්මන් මිලදී ගැනීමේ තත්ත්වය | ↑3 | **11** | **8** | 10 | 6 | 6 | 3 | 8 |

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය**

SLOTS විසින් 2022 දෙසැම්බර් 01 සිට 2023 ජූනි 30 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 4,036 මත පදනම් ව ඇස්තමේන්තු සකස් කර ඇත. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, වාර්ගිකත්වය, අධ්‍යාපනය, අංශය, පළාත සහ සමාජ ආර්ථික තත්ත්වය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි මාසික ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**සම්පූර්ණ වාර්තාව ihp.lk යෙන් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූලි, "ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය:ජූනි මාසයේදී පාරිභෝගික විශ්වාසය සුළු වශයෙන් වෙනස් වූවද, තවමත් අශුභවාදී මට්ටම්වලම පවතී.", SLOTS වාර්තාව #2023-12. http://ihp.lk/publications/docs/SLOTSReport202312.pdf යෙන් ලබා ගත හැකිය.

**පෙර වාර්තාවන් ihp.lk වෙතින් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජුනි, "ශ්‍රී ලංකා පාරිභෝගික විශ්වාසය: අප්‍රේල් මසදී පාරිභෝගික විශ්වාසය ඉහළ මට්ටමට ළඟා වීමෙන් පසුව මැයි මාසයේදී සුළු වශයෙන් වෙනස් වී ඇත", SLOTS වාර්තාව #2023-11. http://ihp.lk/publications/docs/SLOTSReport202311.pdf යෙන් ලබා ගත හැක.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2022 මාර්තු, "SLOTS පාරිභෝගික විශ්වාස පිළිබඳ සමීක්ෂණය: ශ්‍රී ලංකාවේ පාරිභෝගික හැඟීම නිරීක්ෂණය කිරීමේ ක්‍රමවේදය", SLOTS වාර්තාව #2022-01. https://ihp.lk/publications/docs/SLOTSReport202201.pdf යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මගින් ඒකාබද්ධ කරනු ලබයි. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, පළාත, අංශය, සමාජ ආර්ථික තත්ත්වය, ජනවාර්ගිකත්වය, අධ්‍යාපන මට්ටම භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම පාරිභෝගික විශ්වාසනීය දර්ශක ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.